වාර්ෂික වාර්තාව - 2015

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

<u>වාර්ෂික වාර්තාව - 2015</u>

<u>පටුන</u>

ගරු සභාපතිතුමාගේ පණිවුඩය

(01) අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 01 - 13

(02) විගණකාධිපති වාර්තාව 14 - 20

(03) ගිණුම් ප්‍රතිපත්ති 21 - 25

(04) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 26

(05) නිෂ්පාදන වෙළඳ හා ලාභා'ලාභ ගිණුම 27 - 28

(06) මුදල් ප්‍රවාහ ප්‍රකාශය 29

(07) ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය 30

(08) ගිණුම් පිළිබඳ සටහන් 31 - 32

සභාපතිතුමාගේ පණිවිඩය,

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ආරම්භ කර වසර 46 ක කාලයක් සම්පූර්ණ කර ඇත. ලෝක ආර්ථිකයේ වෙනස්කම් මත ශ්‍රී ලංකාවේ ආර්ථිකය ද ඊට සමතුලිතව වෙනස් විය යුතුය. ඒ සඳහා තරඟකාරී වෙළඳපළට ද අප ප්‍රවිශ්ඨ විය යුතුව ඇත.

වර්තමානයේ පෞද්ගලික ආයතන තරඟකාරී වෙළඳපළේ විශාල කොටසක් අත්පත් කර ගෙන සිටී. එබැවින් රාජ්‍ය ආයතනයක් ලෙස අප එම තරඟයට මුහුණ දිය යුතුය. මෙම තරඟාකාරීත්වයට මුහුණ දීමේ දී පෞද්ගලික වෙළඳපළ ඉලක්ක කර ගත් නව ශාකසාර නිෂ්පාදන අප විසින් නිෂ්පාදනය කළ යුතුව ඇත.

2015 වර්ෂයේ දී නව ශාකසාර නිෂ්පාදනාගාරයක් අප විසින් ආරම්භ කරන ලද්දේ එම අභියෝගයට ප්‍රති උත්තර වශයෙනි. වර්තමානය වන විට අප තරඟකාරී වෙළඳපළට ප්‍රවිශ්ඨ වී ඇති අතර ,මෙරට ප්‍රධානතම ව්‍යාපාරික අලෙවි ආයතනය වන සී/ස. කාගිල්ස් පෞද්ගලික සමාගම අපගේ නිෂ්පාදන වෙළඳපළට අලෙවි කරන ප්‍රධාන අලෙවිකරුවා බවට පත් කර ගැනීමට අප සමත්ව සිටිමු. ප්‍රමිතිගත නිෂ්පාදන ඉහල මට්ටමින් ඉදිරිපත් කිරීම පමණක් නොව ඒවායේ ඇසුරුම් ද වෙළඳ පළ ආකර්ෂණය කර ගන්නා පරිදි සකස් කිරීමට ක්‍රමානුකූලව පියවර ගනිමින් සිටිමු.

මීට අමතරව නව අලෙවි ශාඛා දිවයින පුරා ආරම්භ කිරීමට ද සැළසුම් කර ඇති අතර,ඉදිරි වර්ෂ වලදී මෙම ශාඛා කාර්යාල විවෘත කිරීමට ද, අලෙවිකරණය ගමට ගෙන යාමේ අරමුණෙන් පළාත් මට්ටමින් පලාත් ප්‍රාදේශීය කාර්යාල ආරම්භ කිරීමට ද සැළසුම් කර ඇත. දීර්ඝ කාලයක් වෙන්ව පැවති ආයුර්වේද ක්ෂේත්‍රය සෞඛ්‍ය අමාත්‍යාංශ ව්‍යූහයට එක් වීමත් ඒ සඳහා වර්තමාන සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතමාගේ මැදිහත් වීමත් මෙහිලා මූලික කොට සළකමු.

ලාල් සමරසිංහ

සභාපති

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2015 වර්ෂය

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2015.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව දේශීය වෛද්‍ය ගරු ඇමතිතුමා වෙත ගෞරවයෙන් පිළිගන්වමි.

(01) හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් එවකට සිටි කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කරන ලදී.

(02) දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කරගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කරගත් පුරෝගාමී ආයතනයක් වීම.

(03) මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරලමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

(04) <u>ප්‍රධාන අරමුණු</u>

01. ආයුර්වේද ඖෂධ වර්ග භෛසජ්‍ය ද්‍රව්‍ය සහ සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.

02. අත්‍යවශ්‍ය ආයුර්වේද, සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ යන දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.

03. දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.

04. ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.

05. ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.

06. ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළඟිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වා ගෙන යාම.

07. ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

(05) <u>ව්‍යාපාර ස්ථාන</u>

5.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

මහරගම නාවින්න පාරේ අංක 94 දරණ ස්ථානයේ පිහිටා ඇත.

5.2 අලෙවි මධ්‍යස්ථාන

විජේරාම (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ.
මහනුවර (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 70, යටිනුවර වීදිය, මහනුවර.
දියතලාව	: සනානි මන්දිරය, දියතලාව
අනුරාධපුරය	: අංක 414/2, සිරිමෙවන් මාවත, දෙවන පටුමඟ, අනුරාධපුරය.
බදුල්ල	: බී 35/36, පළමු මහල, බස්නැවතුම්පොළ, බදුල්ල.
කොටුව	: කොටුව දුම්රිය ස්ථානය, 2 වන වේදිකාව, කොටුව.
නාවින්න	: අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම.
රත්නපුර	: අංක 32, බස්නැවතුම්පොල පාර , රත්නපුර.
තංගල්ල	: අංක 23, මුහුදු මාවත, තංගල්ල
යාපනය	: අංක 61 A , නව වෙළඳ සංකීර්ණය, යාපනය.
ගාල්ල	: අංක 38 ,ඕල්කට් මාවත, (දංගෙදර වීදිය) ගාල්ල.
සෙත්සිරිපාය	: සෙත්සිරිපාය, බත්තරමුල්ල.
මොණරාගල	: අංක 267, වැල්ලවාය පාර, මොණරාගල.
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	: විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

(06) අධ්‍යක්ෂ මණ්ඩලය

1. කීර්ති ලාල් සමරසිංහ මහතා	-	සභාපති
2. සඳරුවන් ලංකේෂ්වර මහතා	-	කළමනාකාර අධ්‍යක්ෂ
3. එෆ්.එම්.එන්.ආර්.අබේවර්ධන මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4. වෛද්‍ය ඩබ්.කේ.දයානන්ද මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5. එච්.වයි. පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6. එස්.කේ. කුලතුංගමුදලි මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. ආර්. රුෂාන්දන් මහතා	-	භාණ්ඩාගාර නියෝජිත

(07) විධායක නිලධාරි මණ්ඩලය

1. සභාපති	-	කීර්ති ලාල් සමරසිංහ මහතා
2. කළමනාකාර අධ්‍යක්ෂ	-	සඳරුවන් ලංකේෂ්වර මහතා
3. සාමාන්‍යාධිකාරි	-	ජ්ම්.ජේ.මාරසිංහ මහතා
4. සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)	-	ගයත්‍රි හේරත් මෙනවිය
5. නිෂ්පාදනාගාර කළමනාකරු	-	කේ.ඩී.එම්. අර්ජුන චන්ද්‍රසේකර මහතා
6. අලෙවි කළමනාකරු	-	ඩී.ජ්ස්. බර්නාඩ් කාරියවසම් මහතා
7. කළමනාකරු මානව සම්පත්	-	ලංකා වරකාගොඩ මෙනවිය
8. කළමනාකරු මුදල්	-	කැලුම් පතිරවසම් මහතා
9. කළමනාකරු තත්ත්ව පාලන	-	ජ්ම්.ජ්.ඩී.ඩී.සී. මන්ත්‍රිරත්න මෙනවිය
10. ප්‍රධාන වෛද්‍ය නිලධාරී (වැ.බ)	-	සෝමා නාමසිංහ මිය
11. වෛද්‍ය නිලධාරී	-	ඕෂධි පතිරණ මිය
12. වෛද්‍ය නිලධාරී	-	නිල්මිණී ගුණසේකර මිය
13. වෛද්‍ය නිලධාරී	-	දමයන්ති කොඩිකාර මිය
14. ප්‍රසම්පාදන හා අධීක්ෂණ නිලධාරී	-	එස්.එල්. කැකිරදෙණිය මහතා
15. ගණකාධිකාරී	-	ජ්.ඩී.එස්. ප්‍රේමසිංහ මිය

<u>(08) කාර්ය මණ්ඩල සංයුතිය</u>

2015 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

තනතුරු නාමය	කාර්යාලය	නිෂ්පාදනාගාරය	බිංජ්රාම අ.ම	කාවිත්ත අ.ම	මහනුවර අ.ම	දියතලාව අ.ම	බදුල්ල අ.ම	අනුරාධපුරය අ.ම	ඕටකොටුව අ.ම	කෑගල්ල අ.ම	රත්නපුර අ.ම	මොණරාගල අ.ම	ගාල්ල අ.ම	හෙක්ඩිපාය අ.ම	විශ්‍රාම වැටුප් දෙ: අ.ම	යාපනය අ.ම	නිකවැරටිය ඔසු උයන	වෙරහැර අ.ම	එකතුව
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	02	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	02
කළමනාකරුවන්	04	05	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	09
කණිෂ්ඨ කළමනාකරුවන්	12	02	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	14
කළමනාකාර සහකාර සේවා තාක්ෂණික නිලධාරීන්	01	13	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	14
කළමනාකාර සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන්	50	10	01	01	01	01	01	-	01	01	01	01	01	01	-	01	-	-	72
ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය නිලධාරීන්	-	12	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	12
ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නිලධාරීන්	-	12	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	12
ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන නිලධාරීන්	23	101	03	02	01	01	01	02	01	01	01	01	02	-	01	01	01	02	145
කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්	25	32	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	57
අනියම් කම්කරු / තාවකාලික කම්කරු	-	06	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	06
එකතුව	117	193	04	03	02	02	02	02	02	02	02	02	03	01	01	02	01	02	343

(09) සේවක දිරි දීමනා සහ සුබසාධනය

සේවක දිරි ගැන්වීම්

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පැමිණීමේ දිරි දීමනාව, නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව හා ඵලදායීතා දීමනාව ලබා දීම ද ඊට අමතරව වාර්ෂිකව ප්‍රසාද දීමනා හා ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීමද සිදු කෙරේ.

සේවක සුභසාධනය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ වන සියළුම සේවකයින් හා අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සඳහා නිල ඇඳුම් ලබාදෙන අතර, සංස්ථාවේ සියළුම සේවකයින්ට උදෑසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දෙයි. සංස්ථාවේ සියළුම සේවකයින්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා තෙදිනක වාර්ෂික විනෝද චාරිකාවක් යාමට සංස්ථාවේ අනුග්‍රාහකත්වය ලබා දී ඇත. අවමංගල්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම ඇතුළුව අනෙකුත් පහසුකම් ලබා දී ඇත. අප්‍රේල් මස අවුරුදු උත්සවය සඳහා රු.5,500.00ක තෑගි වවුචර් පත්‍රයක් සියළුම සේවකයින්ට ලබා දී ඇත.

(10) ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.

	ඖෂධ නාමය	ඒකකය	2015 වර්ෂය	2014 වර්ෂය	2013 වර්ෂය	2012 වර්ෂය	2011 වර්ෂය
1	අරිෂ්ට/වයින්	මි.ලී.750	152,594	149,196	130,960	145,552	140,351
2	ආසව	මි.ලී.750	121,840	105,860	142,933	112,948	124,483
3	ක්වාථ	මි.ලී.750	51,795	80,247	60,393	45,945	65,506
4	සිරප්	මි.ලී.750	17,580	18,573	17,769	20,140	21,812
5	තෛල	මි.ලී.750	170,067	171,392	163,484	139,847	147,702
6	චූර්ණ	කි.ග්‍රෑ.	28,756	24,942	29,225	45,945	26,092
7	කල්ක/ලේහ/ලේප	කි.ග්‍රෑ.	20,491	18,360	22,173	19,945	18,360
8	රස	කි.ග්‍රෑ.	2,942	2,505	3,122	1,417	1,618
9	වටිකා/ගුගුල්	කි.ග්‍රෑ.	11,696	10,166	15,233	9,651	14,422
10	**නව නිෂ්පාදන 01**						
	(1) රණහංස රසායනය	කි.ග්‍රෑ.	-	-	139	412	202
	(2) ත්‍රිඵලා පෙති	කි.ග්‍රෑ.	937	988	710	500	1,057
	(3) මේදහරණී පෙති	කි.ග්‍රෑ.	840	808	457	191	256
	(4) මධුරු ධූපය	කි.ග්‍රෑ.	-	-			
	(5) සුපේෂී බාම්	කි.ග්‍රෑ.	21	21	11	27	57
	(6) ජීවාලේප බාම්	කි.ග්‍රෑ.	513	-			
	(6) මධුමේහහරණී පෙති	කි.ග්‍රෑ.	-	-			
11	**නව නිෂ්පාදන**						
	(1) තැම්බුම් හොදි	ග්‍රෑ. 05	158,560	226	151,893	103,680	95,000
	තැම්බුම් හොදි	ග්‍රෑ. 250	-	-		1	
	(2) පේයාව	ග්‍රෑ. 05	274,328	219,784	245,785	147,313	194,000
	පේයාව	ග්‍රෑ. 250	-	10		1	
	(3) පස් පංගුව	ග්‍රෑ. 50	36,742	70,556	44,671	67,924	44,560
	(4) කෝමාරිකා ෂැම්පූ	මි.ලී.95	21,344	11,802	723	8,626	6,263
	(5) ඉරමුසු කුඩු	කි.ග්‍රෑ.	-	-		338	33
	(6) බෙලිගැට මද කුඩු	කි.ග්‍රෑ.	-	-		560	-
	(7) WENIWEL BODY WASH	මි.ලී.300	10,336				
	WENIWEL BODY WASH	මි.ලී.60	16,977				
	වෙනත් නිෂ්පාදන වර්ග						-
	(1) ANTI DIABETIC HERBLE TEA 25 BAGS	පෙට්ටි		-		32	-
	(2) HERBLE CURRY SOUP 5g (EEPORT)	5g		-		500	-
	(3) MIXE HERBLE TEA 1.5g /06 BAGS (EXPORT)	Nos	13,990	3,200		4,320	-
	(4) SPICY HERBLE TEA 5g (EXPORT)	5g		-		500	-
	(5) PANTA KASAYA 60g	කි.ග්‍රෑ.		-		141	-
	(6) OUSHADHA MANJUSA (FINISH GOOD)	පෙට්ටි	17				

(11) රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ.

(රු. දස ලක්ෂ වලින්)

	2015 වර්ෂය	2014 වර්ෂය	2013 වර්ෂය	2012 වර්ෂය	2011 වර්ෂය	2010 වර්ෂය
රාජ්‍ය අංශය	414.35	340.45	336.49	315.98	294.76	263.9
<u>අලෙවි මධ්‍යස්ථානය</u>						
විජේරාම වෙද ගෙදර	12.27	13.30	10.59	6.54	6.36	6.52
ජංගම අලෙවිය	4.42	0.97	0.33	0.12	0.27	
මහනුවර අලෙවි මධ්‍යස්ථානය	7.52	7.96	6.22	6.53	5.37	4.86
දියතලාව අලෙවි මධ්‍යස්ථානය	4.44	5.12	3.05	3.33	1.94	3.44
අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය	3.77	3.81	2.00	1.85	0.98	1.15
බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	3.41	3.27	2.94	2.65	1.77	1.63
පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය	2.22	-	2.22	4.15	3.66	2.89
නාවින්න අලෙවි මධ්‍යස්ථානය	14.79	13.82	12.86	9.78	9.28	8.14
අංක 008 ගබඩාව	10.07	17.34	19.86	23.54	20.38	16.48
රත්නපුර අලෙවි මධ්‍යස්ථානය	19.53	18.01	12.46	9.39	4.74	3.11
තංගල්ල අලෙවි මධ්‍යස්ථානය	3.91	2.84	2.09	1.25	2.17	1.10
විභාග දෙපාර්තමේන්තුව අලෙවි මධ්‍යස්ථානය		-	0.98	1.02	1.01	0.75
යාපනය අලෙවි මධ්‍යස්ථානය	4.3	4.17	4.53	2.89	2.07	1.01
ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	8.02	7.93	5.58	4.65	3.68	1.04
සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය	1.94	1.71	1.67	1.20	0.21	
ජනකලා කේන්ද්‍රය	0	0.002	0.31	0.60	0.03	
මොණරාගල අලෙවි මධ්‍යස්ථානය	1.24	1.42	1.27	0.74		
බත්තරමුල්ල අලෙවි මධ්‍යස්ථානය	0.70	1.17				
වේරහැර අලෙවි මධ්‍යස්ථානය	1.61	1.04				
පාවෙන වෙළඳසැල අලෙවි මධ්‍යස්ථානය	0.23	0.61				
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අලෙවි මධ්‍යස්ථානය	1.15					
මුළු එකතුව	**519.89**	**444.94**	**425.45**	**396.21**	**358.68**	**316.02**

(12) ආදායම බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)

	2015	2014	2013	2012	2011	2010
විකුණුම්	100.00	100.00	100.00	100.00	100.00	100.00
අඩු කළා :- විකුණුම් පිරිවැය	54.76	68.52	62.46	61.81	56.13	72.30
දළ ලාභය	45.24	31.48	37.54	38.19	43.87	27.70
එකතු කළා - වෙනත් ආදායම්	1.15	2.34	2.08	4.68	4.28	1.79
එකතුව	46.39	33.82	39.62	42.87	48.15	29.49
අඩු කළා						
ආයතන හා පරිපාලන වියදම්	21.65	18.50	18.29	19.56	21.81	19.95
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	11.98	10.91	11.65	9.03	8.60	6.77
මූල්‍ය වියදම්	1.62	1.98	0.64	0.01	0.10	1.28
වෙනත් වියදම්	-	-	-	0.62	-	-
මුළු වියදම	35.25	31.39	30.58	29.22	30.51	28.00
මෙහෙයුම් ලාභය	11.14	2.43	9.04	13.65	17.64	1.49
එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම්	0.82	1.23	1.31	3.75	0.55	0.43
බදු අඩු කිරීමට පෙර ලාභය	11.96	3.66	10.35	17.40	18.19	1.92
අඩු කළා						
නිකවැරටිය ඔසු උයන අලාභය	1.03	0.4	0.43	0.45	0.37	0.02
අඩු කළා						
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	4.06	1.46	2.65	4.74	5.16	0.38
ශුද්ධ ලාභය	**6.87**	**1.80**	**7.27**	**12.21**	**12.66**	**1.52**

(13) ලාභ දායකත්වය (රු. මිලියන වලින්)

	2015	2014	2013	2012	2011	2010
විකුණුම්	519.89	444.94	425.45	396.22	358.68	316.02
අඩු කළා :- විකුණුම් පිරිවැය	284.69	304.89	265.72	244.90	201.33	228.48
දළ ලාභය	235.2	140.05	159.73	151.32	157.35	87.54
එකතු කළා - වෙනත් ආදායම්	11.08	9.39	8.85	18.55	15.34	5.64
මුළු ආදායම	246.28	149.44	168.58	169.87	172.69	93.18
අඩු කළා						
ආයතන හා පරිපාලන වියදම්	112.57	82.30	77.82	77.55	78.23	63.04
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	62.31	48.55	49.56	35.80	30.86	21.39
මූල්‍ය වියදම්	8.44	8.81	9.48	0.07	0.37	4.03
වෙනත් වියදම්	-	-	-	2.49	-	-
මුළු වියදම	183.32	139.66	136.86	115.91	109.46	88.46
මෙහෙයුම් ලාභය	62.96	9.78	31.72	53.96	63.23	4.72
එකතු කළා - පොළී ආදායම්	4.28	5.46	6.78	1.45	0.83	0.57
මෙහෙයුම් නොවන ආදායම්	0.25	1.01	5.59	13.44	1.15	0.72
නිකවැරටිය ඔසු උයන (අලාභය)	(5.36)	(1.78)	(1.83)	(1.79)	(1.33)	-
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	(21.10)	(6.51)	(11.28)	(18.78)	(18.52)	(1.20)
ශුද්ධ ලාභය	**41.03**	**7.96**	**30.98**	**48.28**	**45.36**	**4.81**

(14) ඖෂධ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටළු

අප නිෂ්පාදන සඳහා බොහෝ අමුද්‍රව්‍ය මෙතෙක් අප සපයා ගනු ලැබුවේ දේශීය සැපයුම්කරුවන්ගෙනි. ඔවුන්ට ද පවතින නිති රිති අනුව වනාන්තර වලින් ඖෂධ ලබාගැනීමේ ගැටළුව තද බල ලෙස බලපා ඇත. මේ සඳහා යම් පිළියමක් ලෙස නිකවැරටිය රන්දෙනිගම ඔසු උයනේ ඖෂධ වගා කිරීම තුළින් යම් සහනයක් ලබා ගත්ත ද, මෙම ගැටළුව සම්පූර්ණයෙන් විසඳා ගැනීමට අපහසු බැවින් අනුරාධපුර වැනි ප්‍රදේශ වල වියළි ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම තුළින් මෙම ගැටළුව විසඳා ගැනීමට යම් පිටුවහලක් අපේක්ෂා කෙරේ.

(15) සංස්ථාවේ නිෂ්පාදනාගාරය සහ ගබඩා පහසුකම් පුළුල් කිරීම

දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර බොහෝමයක් නව වෙළඳපලට හඳුන්වා දී ඇති බැවින් එම යන්ත්‍ර පිළිබඳව අධ්‍යයනයක් කර අප සංස්ථාවට ගැලපෙන යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන පතිරගොඩ නව නිෂ්පාදනාගාරයේ ස්ථාපිත කිරීමටත් ඒ තුළින් අපේක්ෂිත හා ඵලදායි නිෂ්පාදනයක් කිරීමට අපෙක්ෂා කෙරේ.

එම නිෂ්පාදන ගබඩා කිරීම සඳහා දැනට පතිරගොඩ නව නිෂ්පාදනාගාරයේ ගබඩා සංකීර්ණය භාවිතා කරන අතර, දැනට ඉදිවෙමින් පවතින සිව් මහල් ගබඩා සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු අවසන් වූ වහාම එම ගැටළුව විසඳා ගැනීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව උතුරු මැද, උතුර, නැගෙනහිර වැනි පළාත් වලට අවශ්‍ය කරන නිෂ්පාදන අනුරාධපුර ප්‍රාදේශීය ගබඩාවක් මගින් ඖෂධ බෙදාහැරීමට අපේක්ෂා කෙරේ.

(16) විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 2015 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වා ඇති අතර, එහිදී විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම්ද, අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම්ද සාකච්ඡා කර එහි දක්වා ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකරනු ලැබේ. මෙයට අමතරව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ රැස්වීම් මාස 03 කට වරක් පවත්වන අතර, එහිදි විගණන විමසුම් වලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියද සලකා බලන ලදී.

2015 වර්ෂයේ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික මණ්ඩලයේ විස්තර පහත දැක්වේ.

ආර්. රුෂාන්දන් මහතා	-	භාණ්ඩාගාර නියෝජිත	-	කමිටු සභාපති
එස්.එම්.එන්.ආර්.අබේවර්ධන මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	-	කමිටු සාමාජික
වෛද්‍ය ඩබ්.කේ.දයානන්ද මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	-	කමිටු සාමාජික
එම්.ආර්.බී. ප්‍රනාන්දු මිය	-	සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ නියෝජිත	-	කමිටු සාමාජික
එස්.ඒ.ඩී.එන්. පෙරේරා මිය	-	රජයේ විගණන අධිකාරි	-	කමිටු නිරීක්ෂක
යූ. ජයරත්න මහතා	-	අභ්‍යන්තර විගණක	-	කැඳවුම්කරු/කමිටු ලේකම්

(17) මූල්‍ය කළමනාකරණය හා විගණන විමසුම් පිළිබඳ අදහස්

සංස්ථාවේ ගිණුම් පද්ධතිය තුළ පවතින විවිධ අඩුපාඩු හා පද්ධති දුර්වලතා පිළිබඳව විගණකාධිපති විසින් වරින් වර විගණන විමසුම් වලින් පෙන්වා දෙනු ලැබේ. මෙයට අමතරව පාර්ලිමේන්තු පොදු කාරක සභාවේද එම අඩුපාඩු පෙන්වා දුන් අතර, දැනටමත් එම අඩුපාඩු හා දුර්වලතා විගණන හා කළමනාකරණ කමිටුව විසින් දෙනු ලබන උපදෙස් හා මඟපෙන්වීම අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට 2015 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි.

ස්තුතියි.

- ❖ නිවැරදි මඟපෙන්වීමක් කළ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමාටත්, ඩී.එම්.ආර්. බී. දිසානායක ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ සංස්ථාවේ ප්‍රාග්ධන හා අයභාර වැඩිදියුණු කිරීම සඳහා සහාය දුන් මහාභාණ්ඩාගාරයටත්,
- ❖ නොමඳ සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත් ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත්පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- ❖ පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මඟපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමි.

(ලාල් සමරසිංහ)
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/සී/ඒඩීසී/ 1/15/32 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජනවාරි 05 දින

සභාපති,

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 08 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. එයට වැඩිමනත් වශයෙන් මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකි විය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

2015 දෙසැම්බර් 31 දිනට වූ රු.1,923,741 ක ප්‍රාග්ධන සංචිතය (capital reserve) හා රු.19,523 ක විදේශ විනිමය සැසඳුම් සංචිතයේ (foreign exchange reconciliation

reserve) ස්වභාවය හා අරමුණු පිළිබඳ ප්‍රමිතයේ 79(ආ) ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

(i) 2009 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 06 ක කාලයක් තිස්සේ සංචිත යටතේ පෙර වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබුණු රු.38,613,358 ක් සමාලෝචිත වර්ෂයේදී රඳවාගත් ඉපැයීම් ගිණුමට බැර කර තිබුණු නමුත් ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව එම ශේෂය පිළිබඳව විස්තරාත්මක දත්ත හා තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් රු.15,715,396 ක් වූ අවසාන නිමි තොග අඩුවෙන් ගැලපීම නිවැරදි කිරීමේදී ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේ රඳවාගත් ඉපයීම්වල ආරම්භක ශේෂයට ගලපා තිබූ අතර ඒ පිළිබඳව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**

ආදායම් බදු වියදම හා ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.104,988,115 ක් වූ දේපල පිරියත හා උපකරණ තවදුරටත් සංස්ථාවේ කටයුතු සඳහා උපයෝජනය කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

(i) රජයේ ප්‍රදාන වැයකර මිළදීගෙන තිබුණු වත්කම්වලට අදාළව රු.1,237,316 ක් වූ වාර්ෂික ක්ෂය වියදමට සමාන අගයකින් රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයට පෙර වර්ෂවලදී රජයේ ප්‍රදානවලින් අත්පත් කර ගෙන තිබුණු වත්කම් වෙනුවෙන් රු.94,410,400 ක් ක්‍රමක්ෂය කර තිබුණු නමුත් ඊට අදාළ වත්කම් හඳුනාගෙන නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

සංස්ථාව විසින් ඉහළ කළමනාකරණය වෙත ගෙවූ කෙටි කාලීන සේවක ප්‍රතිලාභ, වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

(i) ප්‍රමිතයේ 9 ඡේදය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට රු.86,681,085 ක් වූ වෙළඳ ණයගැතියන්ගේ ක්‍රමක්ෂය වටිනාකම (amortized cost) මැනීමකින් තොරව බොල් හා අඩමාණ ණය සඳහා රු.2,493,761 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ii) සේවක ණය ක්‍රමක්ෂය වටිනාකම (amortized cost) මැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල පොලී අනුපාතය, සඵල පොලී අනුපාතය ලෙස යොදාගත යුතු වුවත්, 2013 හා 2014 වර්ෂවලදී සඵල පොලී අනුපාතය ලෙස යොදාගත් සියයට 12 ක් වූ අනුපාතයම සාධාරණ හේතු හෙළිදරව් කිරීමකින් තොරව 2015 දෙසැම්බර් 31 දිනට රු.16,710,369 ක් වූ සේවක ණය ක්‍රමක්ෂය වටිනාකම ගණනය සඳහා යොදා ගෙන තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණු රු.141,243 ක් වූ පුනරාවර්තන වියදම්, ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ජංගම නොවන වත්කම්වල වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය රු.54,655 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ණයගැතියන්ගෙන් ලද රු.163,083 ක් විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ගිණුම් විෂයයන් 2 ක ලෙජර් ගිණුම් අනුව ශේෂය හා උපලේඛන/ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය අතර එකතුව රු.2,340,683 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර විස්තර පහත දැක්වේ.

	ගිණුම් විෂයය	ලෙජර් ගිණුම අනුව ශේෂය	උපලේඛන හෝ ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය	වෙනස
		රු.	රු.	රු.
(අ)	විකුණුම්	519,887,808	522,196,560	2,308,752
(ආ)	ලංකා බැංකු ස්ථාවර තැන්පතු	1,747,780	1,715,849	31,931
				2,340,683

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
		රු.	
(අ)	බාහිර පාර්ශවයන්ට පරිත්‍යාග කරන ලද ඖෂධ	765,352	විධිමත් අනුමැතීන්
(ආ)	පාරිතෝෂික ප්‍රතිපාදනය	3,958,216	ගණනය කිරීමට අදාළ උපලේඛන
(ඇ)	රඳවාගත් ඉපැයුම් ගිණුමට සිදුකර තිබුණු ගැලපීම්	93,373,135	ජර්නල් සටහන්

2.3 ලැබිය යුතු ගිණුම්

2012 ජනවාරි 01 දින සිට ලැබිය යුතුව තිබුණු රු.243,031 ක ආදායම හඳුනාගැනීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොකෙරුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් එම ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් සිදුකරද නොතිබුණි.

2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, එකතුව රු.353,359,512 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.41,058,076 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,968,428 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.33,089,648 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු.2,627,298 කින් අඩුවීම හා පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.44,027,383

කින් වැඩිවී තිබුණ ද විකුණුම් රු.74,946,110 කින් වැඩිවීම හා විකුණුම් පිරිවැය රු.20,198,388 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.62,731,392 ක් වූ අතිරික්තය 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.42,255,668 ක් හා රු.14,474,024 ක් දක්වා අඩුවී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.62,153,332 ක් දක්වා නැවත වැඩිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.194,292,276 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂය වන විට රු.245,255,493 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 13.75 කින් හා සියයට 6.1 කින් වැඩිවී තිබුණු අතර ජංගම අනුපාතය සියයට 27.63 කින් අඩුවී තිබුණි.

3.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, මෙහෙයුම් පිරිවැය හෝ ජීවන චක්‍ර පිරිවැය (Operational cost or life cycle cost) ගණනය කර ලංසු ඇගයීම සිදු නොකර යන්ත්‍රයේ පිරිවැය පමණක් ඇගයීමට ලක්කරමින් සමාලෝචිත වර්ෂයේදී රු.4,929,309 ක් වැය කර තේ ඇසුරුම් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මිලදී ගෙන තිබුණු යන්ත්‍රයේ තිබිය යුතු තාක්ෂණික පිරිවිතර 3 ක් සංතෘප්ත කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

ගිණුම් පිලියෙළ කිරීමේ පදනම සහ ගිණුම් ප්‍රතිපත්ති - 2015

1. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් පළ කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 මාර්තු 09 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2. මිනුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිලියෙළ කර ඇත.

(අ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හිනිර්දේශ කර ඇති ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය පදනම් කරගෙන ඒවායේ වර්තමානය අගයයටතේ පෙන්වා ඇත.

(ආ) ව්‍යුත්පන්න නොවන මූල්‍ය සාධන පත්‍ර ඒවායේ සාධාරණ වටිනාකම යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධකය සඳහා කිසිදු ගැලපුමක් කර නොමැත.

3. අඛණ්ඩ පැවැත්ම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙහි නුදුරු අනාගතයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇති අතර සංස්ථාව ඇවර කිරීමක් හෝ වෙළඳාම නතර කිරීමක් අපේක්ෂා නොකරයි.

4. සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමට හැකි වන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වෙනස් කර යලි වර්ගීකරණය කර ඇත.

5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන්ට බලපාන විවිධ විනිශ්චය, උපකල්පන සහ ඇස්තමේන්තු, කළමනාකරණය විසින් සිදු කිරීම අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු, පෙර අත්දැකීම්, උපනති සහ පවතින තත්ත්වයන් යටතේ සාධාරණ යයි විශ්වාස කරනු ලබන අනාගත සිදුවීම් පදනම් කරගෙන කරනු ලබයි. ඒ අනුව සත්‍ය ප්‍රතිඵලය, විනිශ්චය සහ ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ අදාළ උපකල්පනවල වලංගුභාවය නිරන්තරයෙන් පුනරීක්ෂණය කරනු ලබයි. යම් කාලපරිච්ඡේදයකට අදාළ ගිණුම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇත්නම් ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට සහ බලපැවැත්වෙන ඉදිරි කාලපරිච්ඡේද වලට අදාළව එම වෙනස්කම හඳුනා ගෙන ඇත.

ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ගිණුම් පිළියෙළ කිරීමේදී තීරණාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් ප්‍රමාණයන්ට වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත්තේ පහත දැක්වෙන ගණනයන් කෙරෙහිය.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් ගිණුම්කරණය

විලම්බිත බදු සම්බන්ධ වත්කම් සහ වගකීම් ගණනය

6. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවෙහි මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අයිතම,අස්තිත්වය ක්‍රියාකරන ප්‍රාථමික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදලින් (ක්‍රියාකාරී ව්‍යවහාර මුදල) දක්වා ඇත.

(ආ) ගනුදෙනු සහ ශේෂ

විදේශ මුදල් ගනුදෙනු, ක්‍රියාකාරී ව්‍යවහාර මුදලට පරිවර්තනය කර ඇත්තේ ගනුදෙනු සිදුවන දිනයන්හි පැවති විනිමය අනුපාත උපයෝගී කර ගනිමිනි.

7. වත්කම් සහ ඒවායේ තක්සේරු කරන පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල්, බැංකු ශේෂයන් සහ සංස්ථාවේ සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුළ මුදල් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන වත්කම්ය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයක් සංස්ථාව විසින් රඳවා ගැනීමට අපේක්ෂා කරයි.

7.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ,පිරියත සහ උපකරණ වටිනාකම ලෙස දක්වා ඇත්තේ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයක් ඇත්නම් එයද අඩු කළ පසු වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම්ප්‍රමිත අංක 01, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම, හි සඳහන් පරිදි දේපළ, පිරියත සහ උපකරණ වල සාධාරණ වටිනාකම සංක්‍රාන්ති වන දිනයේ සලකනු ලබන පිරිවැය ලෙස පෙන්වීමට ඇති වෛකල්පික නිදහස්වීම සංස්ථාව විසින් තෝරා ගන්නා ලදී.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති අයිතමයන්ගේ පිරිවැයට ගැණුම් මිල සහ ඒවා භාවිතා කළ හැකි තත්ත්වයට ගෙන ඒමට වැය කළ සෘජු වියදම් ඇත්නම් ඒවාද ඇතුළත් වේ.

බැහැර කරන ලද දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන්ගේ ලාභය හෝ අලාභය තීරණය කර ඇත්තේ බැහැර කිරීමෙන් ලැබෙන උත්පාදන සහ දේපළ, පිරියත සහ උපකරණ වල ධාරණ අගය අතර වෙනසින් වන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අනෙකුත් ආදායම් හෝ වියදම් යටතේ දක්වා ඇත.

7.2 ක්ෂය

ක්ෂය ගණනය කරනු ලබන්නේ ක්ෂය කළ හැකි අගය මතය. එනම් වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය වෙනුවට ආදේශිත වෙනත් අගයකින් එහි අවශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන අගය මතය. මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය හඳුනා ගනු ලබන්නේ සරල මාර්ග ක්‍රමයට දේපළ, පිරියත සහ උපකරණ වල එක් එක් කොටසට අයත් අයිතමයන්ගේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාය.
ප්‍රවර්තන කාලපරිච්ඡේදයට හා සසඳන කාලපරිච්ඡේදයන්ට අදාළ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාල සහ ක්ෂය අනුපාතික පහත දැක්වේ.

වත්කම් වර්ගය	ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු)	ක්ෂය අනුපාතිකය (%)
ගොඩනැගිලි	අවුරුදු 20	5%
යන්ත්‍රෝපකරණ	අවුරුදු 06මාස 08	15%
ජල සැපයීමේ උපකරණ	අවුරුදු 06 මාස 08	15%
රසායනාගාර උපකරණ	අවුරුදු 06 මාස 08	15%
කාර්යාලීය උපකරණ	අවුරුදු 10	10%
රථ වාහන	අවුරුදු 05	20%
ආයුධ හා මෙවලම්	අවුරුදු 03	33.33%

වත්කමක ක්ෂය එය ප්‍රයෝජනයට ගන්නා දිනයේ සිට ගණනය කරන අතර එය විකිණුම සඳහා ඉදිරිපත් කිරීමට වර්ගීකරණය කරන දිනය හෝ වත්කම ඉවත් කරන දිනය යන දෙකින් පලමු දිනයේදී ක්ෂය කිරීම නවතනු ලැබේ.

7.3 නොනිමි වැඩ

වාර්තා කරන දිනය වන විට නොනිමි වැඩ සඳහා වැය වූ ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර ප්‍රවර්තන වර්ෂය ඇතුළත වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගත් වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යටතේ පෙන්වා ඇත.

8. මූල්‍ය වත්කම්

සංස්ථාව මූල්‍ය වත්කම් පහත දැක්වෙන ආකාරයට වර්ගීකරණය කර ඇත. ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ පරිණත වීම තෙක් තබාගන්නා ආයෝජන යනුවෙනි. මූල්‍ය වත්කම අත්පත් කරගන්නා අරමුණ මත වර්ගීකරණය රඳා පවතියි. වාර්තා කරන කාලපරිච්ඡේදයේ සහ වාර්තා කරන දිනට සංස්ථාව සතුව ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් කිසිවක් නොමැත. සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට, ගණුදෙනු පිරිවැය එකතු කර හඳුනාගෙන ඇත.

9. තොග

තොගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන දෙකෙන් අඩු අගය පදනම් කරගෙනය. තොගවල පිරිවැය ලෙස දක්වා ඇත්තේ තොග මිලදී ගැනීමේ පිරිවැය, තොග වෙන් කිරීමේ පිරිවැය (පරිවර්තන පිරිවැය) හා පවතින තොග වර්තමාන භාවිතයට දැරූ වියදම්ය.

10. වෙළඳ ණයගැතියෝ

සංස්ථාව විසින් වෙළඳ ණයගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇත්තේ සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලැබීමට ගිවිසුම් ගත හිමිකමක් ඇත්නම් පමණකි.

11. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කර ඇත්තේ අත ඇති මුදල්, බැංකු ජංගම ගිණුම් ශේෂ සහ ඉහල ද්‍රවශීලීත්වයකින් යුතු කෙටි කාලීන තැන්පතුය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අත ඇති මුදල්, සහ බැංකු තැන්පතුය.

12. වගකීම් සහ වෙන්කිරීම්

වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් ඇතුළත ඉල්ලා සිටි අවස්ථාවක ගෙවිය යුතු ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් යටතේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයකදී ගෙවිය යුතු ශේෂ වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමේදී හඳුනා ගත් සියලුම වගකීම් ගිණුම් ගත කර ඇත.

වෙන් කිරීමක් හඳුනා ගෙන ඇත්තේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි සම්මුතික හෝ නීතිමය බැඳීමක් තිබෙන අවස්ථාවක එම බැඳීම පියවීමට ආර්ථික ප්‍රතිලාභයක් ගෙවීමට සම්භාවිතාවක් ඇති අවස්ථාවකදීය.

13. **මහා භාණ්ඩාගාරයේ දායකත්වය**

ප්‍රාග්ධන වත්කම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු සියලුම මුදල් සමුච්චිත අරමුදලෙහි දක්වා ඇත.

14. **ණය ගැණුම්**

ණයට ගැණුම් සාධාරණ වටිනාකමින් ගණුදෙනු පිරිවැය අඩුකර මුලින් හඳුනාගෙන ඇත. ණය ගැණුම් වල ධාරණ අගය වන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයයි.

15. **සේවක විශ්‍රාම ප්‍රතිලාභ**

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

සංස්ථාව විසින් සුදුසුකම් ලබා ඇති සියලුම සේවකයන් වෙනුවෙන් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 19, සේවක ප්‍රතිලාභ, ප්‍රමිතයෙහි නිර්දේශ කර ඇති පරිදි සංස්ථාව විසින් නිර්වචිත ප්‍රතිලාභ, ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය අනුව වාර්ෂිකව ගණනය කර ඇත.

16. **ආදායම් හඳුනාගැනීම**

මුදල් ලැබෙන දිනය නොසලකා සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාව සහ ආදායම විශ්වාසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණය තෙක් සංස්ථාව විසින් ආදායම් හඳුනා ගනියි.

17. **පුනරාවර්තන වියදම් හඳුනා ගැනීම**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ නිශ්චිත ආදායමක් උපයාගැනීම සහ ඒ සඳහා වැය වන පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙනය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට වැය කළ සියලුම පිරිවැය ප්‍රවර්තන වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී බැර කර ඇත.

18. **ආදායම් බදු**

ආදායම් බදු වියදම යටතේ ප්‍රවර්තන වර්ෂයේ ගෙවිය යුතු බදු සහ විලම්බිත බදු ඇතුළත්ය.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
2015.12.31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	31.12.2015	31.12.2014
වත්කම්	රු.	රු.
ජංගම නොවන වත්කම්		
දේපල, පිරියත හා උපකරණ	**209,169,793.91**	166,665,141.88
නෙනිම් වැඩ	**98,024,741.22**	87,101,726.50
අනෙකුත් මූල්‍ය වත්කම්		
සේවක ණය	**7,263,130.10**	10,027,082.56
විලම්භිත බදු	**3,930,632.00**	6,334,189.19
	318,388,297.23	270,128,140.13
ජංගම වත්කම්		
තොගය	**182,046,968.98**	130,583,741.83
මාර්ගස්ථ තොගය	-	-
අනෙකුත් මූල්‍ය වත්කම්		
සේවක ණය	**9,447,238.94**	7,361,199.87
රත්‍රං තොගය	**3,912,464.55**	3,912,464.55
මාජින් ගිණුම	**4,084,156.14**	2,500,000.00
අනේවාසික විදේශ විනිමය	**831,906.16**	738,617.09
විවිධ තැන්පත්	**1,113,002.00**	1,131,002.00
ස්ථාවර තැන්පතු (කෙටිකාලීන)	**77,226,749.80**	75,168,240.02
වෙළඳ ණයගැතියෝ	**84,187,324.58**	47,639,250.95
කලින් ගෙවීම් හා අත්තිකාරම්	**3,899,804.67**	9,737,553.43
බැංකු ශේෂය	**153,139,964.65**	178,148,339.93
	519,889,580.47	456,920,409.67
මුළු වත්කම්	**838,277,877.70**	727,048,549.80
ස්කන්ධය හා බැරකම්		
ස්කන්ධය		
දායක ප්‍රාග්ධනය	**5,000,000.00**	5,000,000.00
	5,000,000.00	5,000,000.00
බාහිර ස්කන්ධය		
මහාභාණ්ඩාගාරය	**254,630,369.28**	338,038,210.00
ලෝක සෞඛ්‍ය සංවිධානය	**3,994,341.00**	3,994,341.00
ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල	**15,000,000.00**	-
ආයුර්වේද පර්යේෂණායතනය	**761,274.00**	761,274.00
	274,385,984.28	342,793,825.00
සංචිත		
ප්‍රාග්ධන සංචිත	**1,923,741.00**	1,923,741.00
ප්‍රත්‍යාගණන ලාභය	**3,873,559.55**	3,873,559.55
විදේශ විනිමය සමකිරීමේ සංචිතය	**19,523.00**	19,523.00
පෙර වර්ෂයේ ගැලපුම් (පැකේජය අනුව)	-	38,613,358.30
අනෙකුත් විස්තීරණ ලාභ	-	-
ලාභලාභ ගිණුමේ ශේෂය	**382,463,694.37**	193,492,205.00
	388,280,517.92	237,922,386.85
	667,666,502.20	585,716,211.85
වගකීම්		
ජංගම නොවන වගකීම්		
ප්‍රතිපාදන සඳහා වෙන්කිරීම්	**3,294,333.00**	5,120,601.00
බැංකු ණය	**59,105,500.13**	52,000,000.08
පාරිතෝෂික වෙන්කිරීම්	**36,772,455.24**	35,018,906.40
	99,172,288.37	92,139,507.48
ජංගම වගකීම්		
වෙළඳ ණයහිමියෝ	**17,780,734.53**	13,953,955.51
ඉදිරි වර්ෂයට ලැබීම්	**361,000.00**	441,000.00
උපචිත වියදම්	**16,039,308.92**	12,602,193.45
ගෙවිය යුතු තැන්පත්	**8,615,498.39**	6,414,008.51
ආදායම් බදු ප්‍රතිපාදන	**28,642,545.29**	15,781,673.00
	71,439,087.13	49,192,830.47
මුළු ස්කන්ධය හා බැරකම්	**838,277,877.70**	727,048,549.80

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
නිෂ්පාදන ගිණුම

	2015	2014
	රු.	රු.
අමුද්‍රව්‍ය පරිභෝජනය		
ආරම්භක තොගය	**44,883,359.06**	51,129,741.00
එකතු කළා :- ගැණුම්	**166,283,636.15**	159,964,933.47
ගැණුම් ආනයන	**3,764,579.11**	147,195.03
	214,931,574.32	211,241,869.50
අඩුකළා :- තොග හානි	**-**	-
	214,931,574.32	211,241,869.50
අඩුකළා :- අවසාන තොගය	**52,783,798.66**	44,883,359.41
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය	**162,147,775.66**	166,358,510.09
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය		
ආරම්භක තොගය	**7,845,074.52**	10,684,760.00
එකතු කළා :- ගැණුම්	**28,528,948.12**	23,118,100.75
	36,374,022.64	33,802,860.75
අඩුකළා :- අවසාන තොගය	**11,060,668.09**	7,845,074.58
පරිභෝජනය කළ ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය	**25,313,354.55**	25,957,786.17
සෘජු ශ්‍රම වියදම්	**62,871,840.95**	53,290,111.68
ආරම්භක දැව්තෙල් තොග	**969,076.00**	252,000.00
වෙනත් සෘජු වියදම්	**13,714,445.00**	15,233,764.92
අඩුකළා :- අවසාන දැව්තෙල් තොග	**859,917.50**	969,076.00
	76,695,444.45	67,806,800.60
ප්‍රාථමික පිරිවැය	**264,156,574.66**	260,123,096.86
කම්හල් පොදුකාර්යය පිරිවැය		
එකතුකළා :- ආරම්භක නොනිමි	**12,646,762.16**	9,071,213.00
වක්‍ර වියදම්	**46,097,771.88**	39,171,394.44
අඩුකළා :- අවසාන නොනිමි	**14,875,406.97**	12,646,762.39
	43,869,127.07	35,595,845.05
වර්ෂයේ මුළු නිෂ්පාදන පිරිවැය වෙළඳ ගිණුමට ගෙන ගියා	**308,025,701.73**	295,718,941.91

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	2015	2014
	රු.	රු.
විකුණුම්	**519,887,807.59**	444,941,698.49
අඩුකළා :- විකුණුම් පිරිවැය	**284,548,893.92**	304,892,030.07
දළ ලාභය	**235,338,913.67**	140,049,668.42
වෙනත් ආදායම්	**5,994,279.01**	8,621,577.31
	241,333,192.68	148,671,245.73
අඩුකළා :- ආයතන හා පරිපාලන වියදම්	**112,568,535.28**	82,300,046.44
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	**62,306,790.48**	48,547,895.94
	174,875,325.76	130,847,942.38
ක්‍රියාකාරකම් වලින් ලද ලාභය	**66,313,118.69**	17,823,303.35
ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම	**(4,159,786.50)**	(3,349,279.74)
බදු අඩුකිරීමට පෙර ලාභය	**62,153,332.19**	14,474,023.61
අඩුකළා :- ලාභය මත බදු වෙන්කිරීම්	**21,095,256.19**	6,505,596.00
බදු පසු ශුද්ධ ලාභය	**41,058,076.00**	7,968,427.61
අනෙකුත් විස්තීර්ණ ආදායම්		
පාරිතෝෂික ආයුගණන ලාභය/(ආලාභය)	**1,182,470.99**	(6,139,731.80)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	**1,182,470.99**	(6,139,731.80)
වර්ෂයේ ලාභය	**42,240,546.99**	1,828,695.81

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
2015.12.31 න් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2015	2014
	රු.	රු.
මෙහෙයුම් කටයුතු		
බදුපෙර ලාභය	**62,153,332.19**	14,474,023.61
ගැලපීම්		
විවිධ වෙන්කිරීම්	**(1,826,268.00)**	927,587.00
වත්කම් ක්ෂයවීම්	**10,033,085.47**	10,010,368.65
භාණ්ඩාගාර ප්‍රතිපාදන (ක්‍ෂය වීම)	**(4,997,440.46)**	
බොල්ණය සඳහා වෙන්කිරීම්	**2,493,761.14**	
පාරිතෝෂික දීමනා ගැලපීම්	**5,140,687.33**	4,116,710.33
පෙර වර්ෂයේ ගැලපීම්	**52,320,542.12**	49,448.17
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ලාභය	**125,317,699.79**	29,578,137.76
කාරක ප්‍රාග්ධන වෙනස්වීම		
තොග (වැඩිවීම) / අඩු විම	**(51,463,227.15)**	13,673,099.29
මාර්ගස්ථ තොග (වැඩිවීම) /අඩු විම	**-**	2,869,330.42
සේවක ණය (වැඩිවීම) / අඩු විම	**677,913.39**	571,504.47
කළින් ගෙවීම් හා අත්තිකාරම් (වැඩිවීම) /අඩු විම	**5,837,748.76**	2,238,726.85
විවිධ තැන්පත් (වැඩිවීම) / අඩු විම	**18,000.00**	2,266,500.00
ණයගැතියෝ (වැඩිවීම) / අඩු විම	**(39,041,834.77)**	39,127,787.05
ණයහිමියෝ වැඩිවීම / (අඩු විම)	**3,826,779.02**	1,884,680.51
ගිණුම්කරණ පැකේජයේ වෙනස වැඩිවීම / (අඩු විම)	**(38,613,358.30)**	(0.17)
ඉදිරි වර්ෂයට ලැබීම් වැඩිවීම / (අඩු විම)	**(80,000.00)**	23,415.00
ගෙවිය යුතු තැන්පත් වැඩිවීම / (අඩු විම)	**2,201,489.88**	3,086,637.51
උපචිත වියදම් වැඩිවීම / (අඩු විම)	**3,437,115.47**	865,663.21
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ලාභය	**12,118,326.09**	96,185,481.90
අඩුකළා :- පාරිතෝෂික දීමනා ගෙවීම	**(2,204,667.50)**	(537,735.00)
බදු ගෙවීම	**(5,830,826.71)**	(12,500,000.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**4,082,831.88**	83,147,746.90
ආයෝජන කටයුතු		
ස්ථාවර වත්කම් වෙනස් වීම	**(52,537,737.50)**	(21,593,977.26)
නෙනිමි වැඩ වෙනස් වීම	**(10,923,014.72)**	(15,609,694.12)
ස්ථාවර තැන්පතු වෙනස් වීම	**(2,058,509.78)**	(3,590,636.52)
මාජින් ගිණුමේ වෙනස් වීම	**(1,584,156.14)**	1,374,335.00
අනේවාසික විදේශ විනිමය ගිණුමේ වෙනස් වීම	**(93,289.07)**	(23,424.47)
අයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(67,196,707.21)**	(39,443,397.37)
මූල්‍ය කටයුතු		
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන	**16,000,000.00**	100,000,000.00
බැංකු ණය, පොලී ආපසු අයකර ගැනීම	**7,105,500.05**	(3,999,999.92)
ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල	**15,000,000.00**	-
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**38,105,500.05**	96,000,000.08
මුදල් හා මුදල් හා සමාන දෑ අතර ශුද්ධ වෙනස් වීම	**(25,008,375.28)**	139,704,349.61
2015.01.01 මුදල් හා මුදල් හා සමාන දෑ	**178,148,339.93**	38,443,990.32
2015.12.31 මුදල් හා මුදල් හා සමාන දෑ	**153,139,964.65**	178,148,339.93

	2015	2014
	රු.	රු.
මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-182315453	**43,238,051.70**	41,423,221.77
මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-272315453	**11,888,029.88**	23,012,460.76
ලංකා බැංකුව-ආයතන ශාඛාව-ගි.අ .00001209	**96,888,883.07**	112,992,657.40
ඉතිරි කිරීමේ ගිණුම	**1,125,000.00**	720,000.00
	153,139,964.65	178,148,339.93

2015 ස්කන්ධය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය
(STATEMENT OF CHANGES IN EQUITY FOR 2015)

විස්තරය	දායක ප්‍රග්ධනය (රු.)	මහා භාණ්ඩාගාරය (රු.)	ලෝක සෞඛ්‍ය සංවිධානය (රු.)	අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (රු.)	ප්‍රාග්ධන සංචිත (රු.)	ප්‍රත්‍යාගණන සංචිත (රු.)	පරිඝණක පැකේජය අනුව සංචිතය (රු.)	විදේශ විනිමය සමකිරීමේ සංචිතය (රු.)	ලාභලාභ ගිණුම (රු.)	අනෙකුත් විස්තිරණ ලාභ (රු.)	එකතුව (රු.)
2015.01.01 දිනට ශේෂය	5,000,000	338,038,210	3,994,341	761,274	1,923,741	3,873,560	38,613,358	19,523	193,492,205	-	585,716,212
වර්ෂය තුල ගැලපීම්	-	(83,407,841)	-	-	-	-	(38,613,358)	-	188,971,489		66,950,290
2015.12.31 දිනට ශේෂය	5,000,000	254,630,369	3,994,341	761,274	1,923,741	3,873,560	0	19,523	382,463,694	-	652,666,503

ගිණුම් සටහන් (NOTE TO ACCOUNTS)

1. 2015.12.31 දිනට සංස්ථාවේ තොග තත්වය පහත දැක්වේ.

1.	අමුද්‍රව්‍ය තොගය (පිරිවැය)	රු.52,783,798.66
2.	නිමි ඖෂධ තොගය (පිරිවැය)	රු.100,916,304.33
3.	ඇසුරුම් තොගය (පිරිවැය)	රු.11,060,668.09
4.	නොනිමි තොගය (පිරිවැය)	රු.14,875,406.97
5.	ලිපිද්‍රව්‍ය තොගය (පිරිවැය)	රු.1,281,862.15
6.	දැව්තෙල් තොගය (පිරිවැය)	රු. 859,917.50
7.	යන්ත්‍ර අමතර කොටස් තොගය	රු.269,011.28

2. 2015.12.31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා විගණන ගාස්තු වශයෙන් රු. 600,000.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

3. 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට සහ 2011 අංක 22 දරණ දේශීය ආදායම් සංශෝධන පනතට අනුව සංස්ථාවේහි මෙහෙයුම් ලාභය 28%ක අනුපාතයකින් ආදායම් බදු වලට යටත් වේ.

	2015 (රු.)
ප්‍රවර්ථන වර්ෂයේ ලාභය මත බදු	18,691,699.00
විලම්භිත බදු	2,403,557.19
	21,095,256.19

4. පහත දැක්වෙන නඩු ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ශවකරුවෙකු කරගෙන විභාග වෙමින් පවති.

පාර්ශවය	තනතුර	නඩු අංකය	අධිකරණය	චෝදනා ස්වභාවය
එම්.කේ.සෝමදාස මයා	ගබඩා පාලක	W/P/HCCRMT/78/07 F	ශ්‍රේෂ්ඨාධිකරණය	අවු.55න් විශ්‍රාම යැවීම.
එච්.බී.ජයවර්ධන මයා	ගබඩා පාලක	MH/33/1191/2015	කම්කරු උසාවිය - පන්නිපිටිය	අවු.59 න් විශ්‍රාම යැවීම.
ආර්.එම්. ලංකාතිලක මයා	ආරක්ෂක නිලධාරි	HC3755/07	මහාධිකරණය - කොළඹ	ජංගම අලෙවි මුදල් වංචාව
මැච්මා කොච්රන් පුද්.සමාගම	සැපයුම්කරුවෙකි	ARB/229/2013 සහ ARB/1622013	වාණිජ මහාධිකරණය	ස්ටීම් බොයිලේරුව සැපයීම වෙනුවෙන් ඇති මුදල්

5. ආනයනික අමුද්‍රව්‍ය හා යන්ත්‍ර අමතර කොටස් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව හා මහජන බැංකුව ගංගොඩවිල ශාඛාව සමඟ ණයවර ලිපි මඟින් ගිවිසුම් වලට එළඹ ඇත.

6. සංස්ථාවේ රත්‍රං තොගය 2015.12.31 දිනට රු.3,912,464.55 කර ගිණුම් ගත කර ඇත. එහි ඇති ප්‍රකාශිත ලාභය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රත්‍යාගත ලාභය ලෙස ගිණුම්වල පෙන්වා ඇත.

7. විකුණුම් වලින් ගිණුම් වල පෙන්නුම් කරනු ලබන්නේ දළ විකුණුම් වලින් වට්ටම් අඩු කළ පසු ශුද්ධ විකුණුම් වේ.

8. ගබඩා අංක 01 / 02 හා අංක 11 ගබඩා වල ඖෂධ නිෂ්පාදනාගාරයක අත්‍යාවශයෙන්ම තිබිය යුතු මිල කල නොහැකි කෞතුක ඖෂධ වර්ග රාශියක් පවතියි. ඒවායේ වටිනාකම ගිණුම් වල ගැලපීම් කර නොමැති අතර ඒකක වශයෙන් 2015.12.31 වන දිනට පහත දැක්වේ.

i.	මුතු සිප්පි කිලෝ	86.35
ii.	මුව අං කිලෝ	52.10
iii.	කස්තුරි ගුලි	23.00
iv.	ශුද්ධ කිරිගරුඬ කිලෝ	4.46
v.	දැලි පොතු කිලෝ	3.00
vi.	රිදී තුත්තනායගම් කිලෝ	18.50
vii.	සුදු ඊයම් කිලෝ	16.80
viii.	පිත්තල තහඩු කිලෝ	2.50

9. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ඖසු ගොවි ව්‍යාපෘති කිහිපයක් සංස්ථාවට තාවකාලිකව භාර දී ඇත. ඒවායේ වත්කම් සංස්ථාව තාවකාලිකව භාරගෙන ඇති අතර දැනට ඔසු ගොවි ව්‍යාපෘති සඳහා වැය දැරීම් සංස්ථාව විසින් සිදු කරනු ලබයි. ඒවායේ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත.

10. සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා අධිකරණ හා උසාවි වලින් පරිත්‍යාග වශයෙන් ලැබෙන අමුද්‍රව්‍ය, ඒවායේ වටිනාකම පවත්නා වර්ෂයේ ටෙන්ඩර් අවම මිල යටතේ ගණනය කර, සංස්ථාවේ විවිධ ආදායම් ලෙසත් අමුද්‍රව්‍ය ගැණුම් ලෙසත් ගිණුම් වල ගැලපීම් කර ඇත.

11. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සතුව පවතින LC 9184 දරණ ලොරි රථය සංස්ථාවේ ඖෂධ බෙදා හැරීම සඳහා සේවයේ යොදවා ඇත.ඊට අමතරව පහත සඳහන් වාහනද සංස්ථාවේ රාජකාරි කටයුතු සඳහා භාවිතයට යොදවා ඇත.

PA – 7161

PA – 7155

GD – 7261

62 – 2440